# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1933/11 - 2015 සැප්තැම්බර් මස 21 වැනි සඳුදා - 2015.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

උතුරු පළාත් සභාවේ 2015 වර්ෂයේ අංක 04 දරන පරිපූරක විධිවිධාන ප්‍රඥප්තිය

2015 මුදල් වර්ෂයේ වියදම් සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014 දෙසැම්බර් 22 වැනි දින අනුමත කරන ලද මූල්‍යමය ප්‍රතිපාදන වෙනුවෙන් පරිපූරක විධිවිධාන යනුවෙන් අංක 01 උපලේඛනයේ දැක්වෙන සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත් පළාත් සභා අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ ඒවාට අනුෂාංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් පිණිස වූ ප්‍රඥප්තියකි.

උතුරු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :

1) මේ ප්‍රඥප්තිය 2015 අංක 04 දරන විසර්ජන (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ යම්කිසි නීතියකට හානියක් නොමැතිව මේ ප්‍රඥප්තියෙහි 2015 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භවන සහ 2015 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන 2015 මුදල් වර්ෂය වෙනුවෙන් 2014 දෙසැම්බර් මස 22 වැනි දිනයෙහි ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රතිපාදනවලට අතිරේකව පරිපූරක විධිවිධාන යනුවෙන් මෙම ප්‍රඥප්තියේ අංක 01 උපලේඛනයේ විධිවිධාන අනුව සීමාවන් ඉක්මවා රුපියල් මිලියන එකසිය හතර දහසකුත්, නවසිය පනස් හත් දහස් හාරසිය අසූ අටකුත් ශත හැත්තෑවක් (රු. 104,957,488.70) වන උතුරු පළාත් සභාවේ වියදම. 2015 මුදල් වර්ෂය සඳහා පරිපූරක ප්‍රතිපාදන

(අ) පළාත් සභා අරමුදලින් හෝ වෙනත් යම් මුදල්වලින් හා

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ආර්) වන වගන්තිය අනුව වෙන් කරන ලද අරමුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ප්‍රදානය කරන ලද හෝ වෙන් කරන ලද අරමුදල්වලින් පියවිය යුතුයි.

සී. වී. කන්දයියා සිවඥානම්,
සභාපති,
උතුරු පළාත් සභාව.

එම්. ජේගු,
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

10-330/1

1A - PG 2606 — 26 (2015/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උතුරු පළාතේ පළාත් සභාව

උතුරු පළාත් සභාවේ මුල්‍ය විසර්ජන (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය අංක 04/2015

2015 වසරේ අංක 04 දරන මූල්‍ය විසර්ජන (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය උතුරු පළාත් සභාව විසින් 2015.08.25 වන දින අනුමත කළ බවත්, ගරු ආණ්ඩුකාරවරයා විසින් 2015.09.10 වන දින සම්මත කළ බවත් මෙයින් දන්වා සිටිමි.

එම්. ජේගු,
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

2015 සැප්තැම්බර් මස 18 වැනි දින,
සභා ලේකම් කාර්යාලය,
A-9 පාර,
කයිතඩි.

10-330/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.